**නියමයන් සහ කොන්දේසි - සෘජු හර (DIRECT DEBIT)**

මෙම DIRECT DEBIT නියමයන් සහ කොන්දේසි පිළිගැනීමෙන්, ඔබ මෙම වෙබ් අඩවිය/යෙදුම හරහා සිදු කරනු ලබන ගෙවීම් ගනුදෙනු සඳහා ඔබේ FriMi ඉතුරුම් ගිණුමෙන් " හර" කිරීමට එකඟ වේ.

1. FriMi DIRECT DEBIT සේවාව සඳහා ලියාපදිංචි වීමෙන්, ගනුදෙනුකරුගේ FriMi පරිශීලක හැඳුනුම්පත (FriMi User ID), වෙළෙන්දාගේ වෙබ් අඩවිය/යෙදුම මත ස්වයංක්‍රීයව තැන්පත් වන බව ගනුදෙනුකරු පිළිගනී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ගනුදෙනුකරු වෙළෙන්දාගේ වෙබ් අඩවියේ/යෙදුමෙහි ගෙවීමේ ක්‍රමය ලෙස FriMi තෝරාගෙන ගෙවීම් ගනුදෙනුවක් අවසන් කිරීමට යන සෑම අවස්ථාවකම, ගනුදෙනුකරුගෙන් වැඩිදුර තහවුරු කිරීමක්/සත්‍යාපනයක් අවශ්‍ය නොවී FriMi ඉතුරුම් ගිණුමෙන් " ගෙවීම් මුදල ස්වයංක්‍රීයව "හර" වෙනු ලැබේ.

2. DIRECT DEBIT සේවාව භාවිතා කරමින් ගනුදෙනුකරු විසින් සිදු කරනු ලබන සියලුම ගෙවීම් සඳහා ගනුදෙනුකරු සම්පූර්ණ වගකීම භාර ගනී. ඒ අනුව, ගනුදෙනුකරු විසින් ගෙවීම් තහවුරු කිරීමේ බොත්තම එබීමෙන් පසු, ගෙවීම සකස් කර ඇති බව සලකනු ලබන අතර නැවත අවලංගු කළ නොහැකි ලෙසින් එය ක්‍රියාත්මක වේ.

3. DIRECT DEBIT සේවාව සඳහා ලියාපදිංචි වීමේ පරම අවදානම ගනුදෙනුකරු සතු වේ. ඒ අනුව, මෙම සේවාව සඳහා ලියාපදිංචි වීමේ ප්‍රතිඵලයක් ලෙස, වෙළෙන්දාගේ වෙබ් අඩවිය/යෙදුම හරහා ගනුදෙනුවක් සිදු කිරීමේ ක්‍රියාවලියේදී ගනුදෙනුකරු විසින් සිදු කරන ලද කිසියම් දෝෂයක/වැරදීමක ප්‍රතිඵල ද ඇතුළුව ගනුදෙනුකරු හට සිදුවන කිසිදු අලාභයක්/හානියක් සඳහා නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී විසින් වගකීම නොදරයි.

4. DIRECT DEBIT සේවාව, ගනුදෙනුකරු හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අවලංගු කරන තෙක් බලපැවැත්වේ.

5. මෙහි අන් ලෙසකින් නිර්වචනය කර නොමැත්තේ නම් මිස, මෙම නියමයන් සහ කොන්දේසි වල ඉංග්‍රීසි කැපිටල් අකුරින් දක්වන ලද නියමයන් ද ගනුදෙනුකරු විසින් දැනටමත් පිළිගෙන ඇති ("ප්‍රධාන ගිවිසුම") නියමයන් සහ කොන්දේසි වල දක්වා ඇති අර්ථයම ගනී.

6. මෙම නියමයන් සහ කොන්දේසි ප්‍රධාන ගිවිසුමේ විධිවිධාන සමඟ කියවිය යුතුය. ප්‍රධාන ගිවිසුමේ ප්‍රතිපාදන මෙහි ඇතුළත් කර තිබේද නැද්ද යන්න නොසලකා ගනුදෙනුකරු එහි විධිවිධානවලට බැඳී සිටී.